සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

ගෘහ ආර්ථික විද්‍යාව I
மனைப் பொருளியல் I
Home Economics I

28 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **පිළිතුරු පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** කුඩා පන්තිකාමරයක අවකාශය විශාල කර පෙන්වීම සඳහා ආලේප කිරීමට වඩාත් උචිත වර්ණය කුමක් ද?
(1) අළු (2) දම්
(3) කහ (4) සුදු
(5) තැඹිලි

**2.** සරල පෘෂ්ඨයක දෘශ්‍ය වයනය වෙනස් කළ හැකි ආකාරයක් වනුයේ,
(1) විවිධ රටා භාවිතයයි. (2) ආර්ද්‍රතාවය පාලනය කිරීමයි.
(3) උෂ්ණත්වය වෙනස් කිරීමයි. (4) සුමට පෘෂ්ඨ භාවිත කිරීමයි.
(5) ආලෝකය අඩු කිරීමයි.

**3.** ගෘහයක ආසාත්මික රිද්මය නිර්මාණය කිරීමෙන් පෙන්නුම් කරනුයේ,
(1) ව්‍යාකූලතාවයයි. (2) අඛණ්ඩතාවයයි.
(3) අසමතුලිතතාවයයි. (4) අවකාශය අඩු බවයි.
(5) අක්‍රමවත් බවයි.

**4.** පහත කරුණු සලකන්න.

A – කාබන් පා සලකුණු වැඩි වීම
B – පරිසරයේ තාපය පාලනය වීම
C – වියදම අසීමිත වීම
D – පුනර්ජනනය කළ හැකි වීම

ඉහත කරුණු අතුරෙන් පැරණි ගොඩනැගිලි නිර්මාණයේ දී පාරිසරික ද්‍රව්‍ය භාවිත කිරීමේ ප්‍රතිඵලය/ප්‍රතිඵල වනුයේ,
(1) A පමණි. (2) B පමණි.
(3) B හා C පමණි. (4) C හා D පමණි.
(5) A , B හා D පමණි.

**5.** සත්ත්වයින්ගේ සහ ශාකවල ශක්තිය ගබඩා කරනු ලබන පොලිසැකරයිඩ පිළිවෙළින් සඳහන් වරණය කුමක් ද?
(1) ග්ලයිකොජන් සහ සෙලියුලෝස් (2) ග්ලයිකොජන් සහ පිෂ්ටය
(3) පිෂ්ටය සහ සෙලියුලෝස් (4) පිෂ්ටය සහ ග්ලයිකොජන්
(5) සෙලියුලෝස් සහ ග්ලයිකොජන්

**6.** අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල සියල්ල ම සහ බහු අසන්තෘප්ත මේද අම්ල බහුලව ම අඩංගු වන ආහාරය තෝරන්න.
(1) මුං ඇට (2) සෝයා මීට්
(3) රටකජු (4) මාළු
(5) කුකුල් මස්

Past Papers Wiki



7. පහත සංයෝග සලකන්න.

A – කෙරටින් B – හීමොග්ලොබින්
C – මයොසින් D – කෝටිසෝන්

ඉහත සංයෝග අතුරෙන් ප්‍රෝටීනමය සංයෝග වන්නේ,

(1) A හා B පමණි. (2) B හා D පමණි.
(3) A , B හා C පමණි. (4) A , C හා D පමණි.
(5) B , C හා D පමණි.

8. නිරෝගී පුද්ගලයෙකුගේ දෛනික ශක්ති අවශ්‍යතාවයෙන් ප්‍රෝටීන මගින් ලබා ගත යුතු ප්‍රමාණය

(1) 1% - 5% අතර වේ. (2) 10% - 15% අතර වේ.
(3) 30% - 40% අතර වේ. (4) 45% - 50% අතර වේ.
(5) 50% - 65% අතර වේ.

9. ශ්‍රී ලංකාවේ දරුවන් අතර සුලබව දැකිය හැකි ක්ෂුද්‍ර පෝෂක ඌණතා රෝග තත්ත්ව දෙකක් සඳහන් වරණය තෝරන්න.

(1) නීරක්තිය, කෘෂ බව (2) තයිරොක්සින් ඌනතාව, නීරක්තිය
(3) කෘෂ බව, අස්ථි විකෘති රෝගය (4) බිටෝලප, විටමින් C ඌනතාව
(5) කුරු බව, මැරස්මස්

10. ආහාර මාර්ගය පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.

A – මුඛය තුළ ක්ෂාරීය මාධ්‍යයක් පවතී.
B – ආමාශය තුළ ආම්ලික මාධ්‍යයක් පවතී.
C – මහා අන්ත්‍රය තුළ ආම්ලික මාධ්‍යයක් පවතී.

මේ අතුරෙන් සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ,

(1) A පමණි. (2) B පමණි.
(3) A හා C පමණි. (4) B හා C පමණි.
(5) A , B හා C යන සියල්ල ම ය.

11. පෝෂණ ගැටලු වැළැක්වීම හා සම්බන්ධ වන රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනයක් පිළිවෙළින් අඩංගු වරණය තෝරන්න.

(1) ආහාර හා කෘෂිකර්ම සංවිධානය, ලෝක බැංකුව
(2) අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික සෞඛ්‍ය විද්‍යායතනය
(3) වෛද්‍ය පර්යේෂණ ආයතනය, සර්වෝදය ව්‍යාපාරය
(4) කෘෂිකර්ම අමාත්‍යාංශය, පවුල් සෞඛ්‍ය කාර්යාංශය
(5) පෝෂණවේදීන්ගේ සංගමය, යුනෙස්කෝ සංවිධානය

12. පහත ප්‍රකාශ අතුරෙන් **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) ආහාර ප්‍රමාණය යනු දිනකට එක් පුද්ගලයෙකු ගත යුතු ආහාර කාණ්ඩ ප්‍රමාණයයි.
(2) පෝෂණ වගුවක, නොපිසූ ආහාර ග්‍රෑම් 100 ක අඩංගු පෝෂක ප්‍රමාණය දක්වා ඇත.
(3) ආහාර පංගුව පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ.
(4) ආහාර පිඟාන සංකල්පයට කිරි හා කිරි නිෂ්පාදන එක්කර ගැනීම අත්‍යවශ්‍ය වේ.
(5) ආහාර පිරමීඩයේ ආහාර කාණ්ඩ හතක් ඇතුළත් කර ඇත.

13. පහත පෝෂක සලකන්න.

A – කාබොහයිඩ්‍රේට
B – ප්‍රෝටීන
C – විටමින් $B_{12}$
D – කැල්සියම්

මේ අතුරෙන් ක්‍රියාශීලී නොවන වැඩිහිටියෙකු වයස්ගත වීමේ දී වෙනස් නොවිය යුතු පෝෂක මොනවා ද?

(1) A හා B පමණි. (2) C හා D පමණි.
(3) A, B හා C පමණි. (4) B, C හා D පමණි.
(5) A , B, C හා D යන සියල්ල ම ය.

[තුන්වැනි පිටුව බලන්න

**14.** මන්දපෝෂණයෙන් පෙළෙන වැඩිහිටියෙකු සඳහා වඩාත් සුදුසු උදය ආහාර වේල අඩංගු වරණය තෝරන්න.

(1) එළවළු සැන්ඩ්විච් සහ සෝයා කිරි
(2) බනිස් සහ කෙසෙල් ගෙඩි
(3) පේස්ට්‍රි සහ කිරිතේ
(4) බටර් තැවරූ පාන් සහ පළතුරු බීම
(5) මඤ්ඤොක්කා සහ ලුණු මිරිස්

**15.** පහත දී ඇති රෝගී තත්ත්වයන් හා ආහාර අතුරෙන් රෝගී තත්ත්වයට උචිත ආහාරය සඳහන් වරණය තෝරන්න.

(1) අධි රුධිර පීඩනය - චීස්
(2) දියවැඩියාව - කැකුළු හාල්
(3) හෘදයාබාධ - තිරිඟු පිටි
(4) ආමාශයික ප්‍රදාහය - අයිස්ක්‍රීම්
(5) ආඝාතය - කුඩා මාළු

**16.** පහත දැක්වෙන ආහාර අතුරෙන් කුඩා දරුවෙකුට අනුපූරක ආහාරයක් ලෙස වඩාත් සුදුසු වන්නේ කුමක් ද?

(1) මුං කිරිබත්
(2) අමු කැරට් සලාදය
(3) පැණි යෙදූ යෝගට්
(4) බිත්තර කෝපි
(5) වැනිලා රසැති කිරි

**17.** පිසීමේ ක්‍රම හා සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.

A - කෙටි කාලයක් තුළ පිසීම සිදු වේ.
B - මාළු හා මස් පිසීමට යොදාගනියි.
C - තාප ප්‍රභව දෙකක් අතර පිසගත හැකි ය.
D - තාප සංක්‍රමන ක්‍රම තුන ම උපයෝගී වේ.

ග්‍රිල් කිරීම හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වනුයේ,

(1) A හා B පමණි.
(2) A හා C පමණි.
(3) A, C හා D පමණි.
(4) B, C හා D පමණි.
(5) A, B, C හා D යන සියල්ල ම ය.

**18.** ආහාර ආසාදනයට හේතුවන බැක්ටීරියා විශේෂය මින් කුමක් ද?

(1) ස්ට්‍රෙප්ටොකොකස් තර්මොෆිලස් (*Streptococcus thermophilus*)
(2) පීඩියෝකොකස් සෙරිවිසියේ (*Pediococcus cerevisiae*)
(3) විබ්‍රියෝ කොලෙරා (*Vibrio cholerae*)
(4) ක්ලොස්ට්‍රීඩියම් බොට්‍යුලිනම් (*Clostridium botulinum*)
(5) ඇසිටොබැක්ටර් ඇසිටයි (*Acetobacter aceti*)

**19.** අධිශීතනය හා සම්බන්ධ **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) සෙමින් සිදුවන අධිශීතනයේ දී ක්ෂුද්‍රජීවී වර්ධනය ඇණ හිටියි.
(2) ජලද්‍රාව්‍ය විටමින් සුරක්ෂිත වේ.
(3) ආහාරයේ අඩංගු එන්සයිම සක්‍රීයව පවතී.
(4) කඩිනම් අධිශීතනයේ දී ආහාරයේ ඇති සමහර ද්‍රව්‍ය පිටතට කාන්දු වේ.
(5) මේද ඔක්සිකරණය පාලනය වේ.

PAST PAPERS WIKI

**20.** ප්‍රොපියොනේට් සහ පැරාබෙන්සොඒට් යන රසායන සංයෝග භාවිතයෙන් පරිරක්ෂණය කරනු ලබන ආහාර වර්ග දෙකක් වන්නේ පිළිවෙළින්,

(1) බේකරි නිෂ්පාදන සහ ජෑම් ය.
(2) මස් සහ පලතුරු පල්ප ය.
(3) කිරි පිටි සහ රසකැවිලි ය.
(4) සිසිල් බීම සහ චීස් ය.
(5) දෙහි සහ වියළන ලද එළවළු ය.

**21.** ආහාර පරිරක්ෂණයේ දී යොදාගන්නා තාප ප්‍රතිකාරක ක්‍රම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ඇසුරුම් කළ ආහාර සඳහා යොදාගනියි.
B - 130 °C - 150 °C උෂ්ණත්වයක ආහාර විනාඩි කිහිපයක් තබයි.
C - ආහාරය වැඩි කාලයක් සුරක්ෂිතව පවතී.
D - උෂ්ණත්වය මගින් ආහාරයට සිදුවන හානි අවම වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් උපරිතාප ක්‍රමය හා සම්බන්ධ වනුයේ,

(1) A හා B පමණි.
(2) A හා D පමණි.
(3) B හා C පමණි.
(4) A, C හා D පමණි.
(5) B, C හා D පමණි.

[හතරවැනි පිටුව බලන්න

Past Papers Wiki



**22.** තෛලෝදකාරකයක් සහ ඝනීකාරකයක් පිළිවෙළින් සඳහන් වරණය තෝරන්න.

(1) කාමයින් සහ ඒගාර් (2) සෝඩියම් ෆොස්ෆේට් සහ පෙක්ටින්
(3) සෝඩියම් ෆොස්ෆේට් සහ කාමයින් (4) ටාට්‍රසීන් සහ ඒගාර්
(5) ටාට්‍රසීන් සහ පෙක්ටින්

**23.** ඕවර්ලොක් මැස්ම හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) මතුපිට මෝස්තර ගැන්වීමට යොදාගනියි.
(2) ඇඳුමේ මතුපිටින් හා නොපිටින් එකම ආකාරයට දිස් වේ.
(3) රෙදි දෙපොටක් සම්බන්ධ කිරීමට යොදාගනියි.
(4) අද්දර නිමකිරීම සඳහා භාවිත කරයි.
(5) තාවකාලික මැස්මක් ලෙස යොදාගනියි.

**24.** වාණිජ මැහුම් ක්‍රම පිළිබඳ නිවැරදි ප්‍රකාශය මින් කුමක්ද?

(1) 201 මැහුම් වර්ගය යටතේ ඇති අත්මැස්ම, රෙදි දෙපොටක් සම්බන්ධ කර ගැනීම සඳහා යොදාගනියි.
(2) සාමාන්‍ය දම්වැල් මැස්ම අයත් වන්නේ 300 මැහුම් වර්ගයට ය.
(3) අගුලු මැස්ම, 103 මැහුම් වර්ගයට අයත් වේ.
(4) නොපෙනෙන මැස්ම මසා අවසානයේ, මැස්ම ගැලවී යාම වැළැක්වීමට නූල් කැබැල්ලක් ඉතිරි කරයි.
(5) තනි නූලේ දම්වැල් මැස්ම සැනගාංචු ඇල්ලීම සඳහා යොදාගනියි.

**25.** ගෘහපිළි නිර්මාණය හා සම්බන්ධ කරුණු කිහිපයක් පහත දැක්වේ.

A - මේස ඇතිරිලි සඳහා සිනිඳු වයනයක් සහිත කපුරෙදි වඩාත් යෝග්‍ය වේ.
B - වෘත්තාකාර මේස ඇතිරිල්ලක් නිර්මාණයේ දී, එය මේසයෙහි විෂ්කම්භයට වඩා සෙ.මී. 3 ක් වාසි සහිතව කපාගත යුතු ය.
C - එම්බ්‍රොයිඩර් මෝස්තර මැසීමේ දී නූල්වල ඝනකම අනුව ඉඳිකටු තෝරාගත යුතු ය.

ඉහත කරුණු අතුරෙන් නිවැරදි කරුණ/කරුණු වනුයේ,

(1) A පමණි. (2) B පමණි.
(3) C පමණි. (4) A හා B පමණි.
(5) B හා C පමණි.

**26.** මූලික මැහුම් ක්‍රමයක් හා මැසීමේ ශිල්පීය ක්‍රමයක් වනුයේ පිළිවෙළින්,

(1) ඇප්ලික් කිරීම සහ ආර මැසීම ය.
(2) නූල් ඇදීම සහ සන්නාලි මැස්ම ය.
(3) සන්නාලි මැස්ම සහ සැනගාංචු ඇල්ලීම ය.
(4) ආර මැසීම සහ ඇප්ලික් කිරීම ය.
(5) සැනගාංචු ඇල්ලීම සහ නූල් ඇදීම ය.

**27.** කෙඳි විශේෂයක හරස්කඩ අන්වීක්ෂීය පෙනුම පහත රූප සටහනෙන් දක්වා ඇත.



මෙම කෙඳි විශේෂය වනුයේ,

(1) සේද ය. (2) ලෝම ය.
(3) විස්කෝස් ය. (4) නයිලෝන් ය.
(5) පොලිඑස්ටර් ය.

**28.** රෙදිපිළි හා ඇඳුම්වලට යොදන නිමාවන් පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ජලරෝධක නිමාව සහිත රෙදි සවිවර බවින් තොර වේ.
(2) සෙලියුලෝස් කෙඳිවලින් නිම වූ රෙදිවලට ගිනිරෝධක නිමාව ලබා දිය නොහැක.
(3) මලහරණය යනු කෙඳිවල ස්වාභාවිකව පවතින අපද්‍රව්‍ය, ග්‍රීස් සහ ඉටි, තනුක අම්ල යොදා ඉවත්කිරීම ය.
(4) එන්සයිම භාවිත කර නිම් ඇඳුම් සේදීමෙන් ඒවායේ වර්ණවල තීව්‍රතාව වැඩි වේ.
(5) රෙදි විවීමෙන් පසු තවදුරටත් රසායනික ක්‍රියාවලීන්ට භාජනය කිරීමට පෙර හරස් නූල්වලට යොදා ඇති කැඳ ඉවත් කළ යුතු ය.

[පස්වැනි පිටුව බලන්න

**29.** **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) ශාකවල ඇති සෙලියුලෝස් අණු වෙන්කර නැවත සකස් කිරීමෙන් පුනර්ජනනීය සෙලියුලෝස් කෙඳි සකස් කරගනියි.
(2) කෘත්‍රිම කෙඳි නිෂ්පාදනයේ දී, පොලිමර් ද්‍රව්‍ය උණුකර, ද්‍රාවණයක් බවට පත්කළ හැකිනම්, ද්‍රව කැටීම තෝරාගත යුතු ය.
(3) කෘත්‍රිම වශයෙන් නිෂ්පාදනය කරන ලද දිග තන්තු කිහිපයක් එකතු කර අඹරා ගැනීමෙන් නූලක් සකස් කරගනියි.
(4) දික් නූල් දෙකක් හා හරස් නූල් දෙකක් එකවර බැඳීමෙන් ජටා වියමන නිර්මාණය වේ.
(5) දික්ගෙතුම සහිත රෙදිවල ඇදීමේ ගතිලක්ෂණය අඩු ය.

**30.** රාමුව ආශ්‍රිතව සාය පතරොම නිර්මාණය කිරීම පිළිබඳව ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - සාය පතරොමෙහි ඉණ රේඛාව තිරස් රේඛාවක් ලෙස පිහිටයි.
B - පතරොම නිර්මාණයේ දී සම්මත මිනුමක් ලෙස ඉණ සඳහා මැහුම් වාසි සෙ.මී. 0.25 ක් එකතු කළ යුතු ය.
C - ඉණ සිට උකුල දක්වා උස උකුල් එල්ලය වේ.
D - අංග රේඛාව සලකුණු කරන්නේ, රාමුව සිරස් ව සමාන කොටස් දෙකකට බෙදීමෙනි.

මින් නිවැරදි ප්‍රකාශ වනුයේ,

(1) A හා B පමණි.
(2) B හා C පමණි.
(3) B හා D පමණි.
(4) A, C හා D පමණි.
(5) B, C හා D පමණි.

**31.** තොරතුරු සම්ප්‍රේෂණ මාධ්‍යයක විශ්වසනීයත්වය අඩු වීමට බලපාන කරුණක් වන්නේ,

(1) තොරතුරුවල නිරවද්‍යභාවය.
(2) භාෂා හැසිරවීමේ නිපුණත්වය.
(3) ඉහළ ප්‍රේක්ෂක සංඛ්‍යාව.
(4) තාක්ෂණික ගුණාත්මක බව.
(5) පක්ෂපාතී වාර්තාකරණය.

**32.** සමාජ උත්සවයක දී උචිත ලෙස පෙනී සිටීම යන සංකල්පය **සාවද්‍ය** ලෙස දැක්වෙන්නේ මින් කුමන අවස්ථාවේදී ද?

(1) අවස්ථාවට අනුකූලව ඇඳුම් පැළඳුම්වල වර්ණ ගැළපීම
(2) සමාජ සම්ප්‍රදායයන් සැලකිල්ලට ගැනීම
(3) අලංකාරය හා වටිනාකම ඉස්මතු වන සේ ආයිත්තම් වීම
(4) සුව පහසුව හා ගෞරවය කෙරෙහි සැලකිලිමත් වීම
(5) අවස්ථාවට අනුකූලව මෝස්තර තේරීම

**33.** විවේකය සහ ප්‍රතිමෝදනය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - පුද්ගලයෙකු ක්‍රියාශීලී විවේක ක්‍රියාකාරකම් සඳහා වැඩි කාලයක් යොදාගත යුතු ය.
B - ප්‍රතිමෝදක ක්‍රියාකාරකම්, විවේකය ගතකිරීමට පමණක් තෝරා ගනියි.
C - ආත්ම විශ්වාසය සහ ආත්ම අභිමානය වර්ධනය වීම හිතකර ප්‍රතිලාභ වේ.
D - සුවිශේෂී ක්‍රියාකාරකම්වල යෙදෙන්නන් සමග ඇසුරුකිරීමට ලැබීම ප්‍රතිමෝදනයෙහි වැදගත්කමකි.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,

(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A හා D පමණි.
(5) C හා D පමණි.

**34.** මානව නිර්මිත ආකර්ෂණය සඳහා උදාහරණ දෙකක් වන්නේ,

(1) ග්‍රහලෝකාගාරය සහ කැලණි පෙරහැර ය.
(2) යාල අභය භූමිය සහ දඹුලු විහාරය ය.
(3) ගාලු කොටුව සහ සිංහරාජ වැසි වනාන්තරය ය.
(4) හෝර්ටන් තැන්න සහ ගාලු කොටුව ය.
(5) සිංහරාජ වැසි වනාන්තරය සහ හෝර්ටන් තැන්න ය.

**35.** සංචරණය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) සංචරණය යටතට ගැනෙන ගමන් කිරීම් හඳුනාගැනීම සඳහා භාවිතවන්නේ උපමාණ දෙකකි.
(2) රජයට අමතර බදු ආදායම් ලැබීම, සමාජයට ලැබෙන ප්‍රතිලාභයකි.
(3) අභ්‍යන්තර සංචරණය, දේශීය සංචරණය හා බාහිර යොමුගත සංචරණයෙන් සමන්විත ය.
(4) රාශිගත සංචරණයේ දී පවුල් හෝ කුඩා කණ්ඩායම් සංචරණයේ යෙදේ.
(5) වනෝද්‍යාන නැරඹීමට යාම රුදෙස් සංචරණයට අයත් වේ.

**36.** සංචරණය හා සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.
A - සංචරණය මගින් පරිසරයට ධනාත්මක හා ඍණාත්මක බලපෑම් ඇතිකරයි.
B - බුටික් හෝටල්වලට සංචාරකයින්ගේ ඉල්ලුම අඩු ය.
C - හෝටල්, චාරිකා නියෝජිතයින්, තම සේවා පිළිබඳ විස්තර අන්තර්ජාලයෙන් ප්‍රචාරය කිරීම ජනප්‍රිය මාධ්‍යයකි.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,
(1) A පමණි. (2) B පමණි.
(3) C පමණි. (4) A හා C පමණි.
(5) B හා C පමණි.

**37.** ජල පරිභෝජනය පිළිබඳ පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි කුමක් ද?
(1) පෘථිවි පෘෂ්ඨයෙහි පවත්නා ජලයෙන් මිනිස් පරිභෝජනය සඳහා යොදාගන්නේ 8% ක් පමණ ය.
(2) ජලයේ වෙසෙන විවිධ බැක්ටීරියා වර්ග ගණනය කිරීම මගින් පානය සඳහා යෝග්‍යතාව තීරණය කරයි.
(3) නෑමට යොදාගත් ජලයෙහි ක්‍රියාකාරී බැක්ටීරියා අඩංගු වේ.
(4) සත්ත්ව මල ජලයට එකතුවීම නිසා පිටගැස්ම, පෝලියෝ හා ගලපටලය ඇතිවිය හැකි ය.
(5) නිවසෙහි උපාංග සඳහා ජලය සපයන නළවල විෂ්කම්භය 25 mm වීම සුදුසු ය.

**38.** පහත දැක්වෙන ගෘහ විද්‍යුත් පරිපථයට අයත් කොටස් අතුරෙන් පාරිභෝගිකයා සතු වනුයේ,
(1) අධිධාරා පරිපථ බිඳිනය සහ විබෙදුම් පෙට්ටියයි.
(2) විදුලි මීටරය සහ වෙන්කරණයයි.
(3) වෙන්කරණය සහ විබෙදුම් පෙට්ටියයි.
(4) අධිධාරා පරිපථ බිඳිනය සහ විදුලි මීටරයයි.
(5) විබෙදුම් පෙට්ටිය සහ විදුලි මීටරයයි.

**39.** ගෘහ විදුලි සැපයුම හා සම්බන්ධ පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ප්‍රත්‍යාවර්ත ධාරා විදුලිය බැටරි මගින් ලබා ගනියි.
(2) පේනුවකට සම්බන්ධ කරන උදාසීන රැහැන නිල් පැහැති ය.
(3) ධාරාව මැනීමේ සම්මත ඒකකය ඕම් වේ.
(4) LED විදුලි පහන් භාවිත කරන විද්‍යුත් ශක්ති ප්‍රමාණය සාමාන්‍යයෙන් 15 W - 22 W වේ.
(5) ලෝහමය කොටස් සහිත ආවරණයක් ඇති විදුලි උපකරණවලට දෙකුරු පේනුවක් යොදාගත හැකි ය.

**40.** පහත දැක්වෙන ශක්ති ප්‍රභව අතුරෙන් පුනර්ජනනීය ශක්ති ප්‍රභවයක් හා පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභවයක් පිළිවෙළින් අඩංගු වරණය තෝරන්න.
(1) සූර්යාලෝකය සහ ස්වාභාවික වායුව
(2) බොරතෙල්වලින් ගන්නා ඉන්ධන සහ සූර්ය තාපය
(3) සාගර තරංග සහ සූර්යාලෝකය
(4) බොරතෙල්වලින් ගන්නා ඉන්ධන සහ සාගර තරංග
(5) ස්වාභාවික වායුව සහ සූර්යතාපය

**41.** ස්වාභාවික සම්පත් ප්‍රශස්ත ලෙස පරිභෝජනය කිරීම නිසා ඇති **නොවන** තත්ත්වය කුමක් ද?
(1) පරිසර සමතුලිතතාව ආරක්ෂා වීම
(2) ජෛව විවිධත්වය ඇති වීම
(3) සම්පත් හිඟතාවයක් ඇති නොවීම
(4) ස්වාභාවික චක්‍රවල අසමතුලිතතාව ඇති වීම
(5) ජනතාවගේ සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු වීම

**42.** පහත කරුණු සලකන්න.

A - අසම්පූර්ණ දහනය සිදුවීම
B - සම්පූර්ණ දහනය සිදුවීම
C - විෂ වායු නිෂ්පාදනය වීම

ඉහත කරුණු අතුරෙන් අඩු උෂ්ණත්වයක අපද්‍රව්‍ය දහනය කිරීමෙන් බහුලව සිදුවිය හැකි ප්‍රතිවිපාකය/ප්‍රතිවිපාක වනුයේ,

(1) B පමණි. (2) C පමණි.
(3) A හා B පමණි. (4) A හා C පමණි.
(5) B හා C පමණි.

**43.** කොම්පෝස්ට් සෑදීමේ දී නිතර පෙරළීම වඩාත් වැදගත් වනුයේ,

(1) අන්තර්ගත ජලය අඩුකිරීමට ය.
(2) උෂ්ණත්වය අඩු කිරීමට ය.
(3) වායු සැපයුම වැඩි කිරීමට ය.
(4) කසල වෙන් කිරීමට ය.
(5) දුර්ගන්ධය වැළැක්වීමට ය.

**44.** ඝන අපද්‍රව්‍ය මනා කළමණාකරණය සඳහා කළ යුතු වන්නේ කුමක් ද?

(1) විවෘතව දහනය කිරීම
(2) බැහැර කිරීමේ ඉඩකඩ සීමා කිරීම
(3) සංවෘත අවකාශයක දහනය කිරීම
(4) විවෘතව ගොඩ ගැසීම
(5) ඝන ද්‍රව්‍ය සුසංහිතව ඇසිරීම

**45.** යොවුන් අවධිය හා සම්බන්ධ පහත කරුණු සලකන්න.

A - ගැහැනු දරුවන්ගේ යොවුන් විය ආරම්භය සාමාන්‍යයෙන් අවුරුදු 10න් පසුව සිදු වේ.
B - පිරිමි දරුවන්ගේ මේද පටක හා පේශී පටක වර්ධනය වේගවත් වේ.
C - උස වැඩි වීම ගැහැනු හා පිරිමි දරුවන්ගේ එකම වයසක දී ආරම්භ වේ.
D - යොවුන් දරුවන්, පරිනත ප්‍රජනක සෛල සිරුර තුළ ගබඩා කර තබාගනියි.

ඉහත කරුණු අතුරෙන් නිවැරදි කරුණ/කරුණු වනුයේ,

(1) A පමණි. (2) C පමණි.
(3) A හා C පමණි. (4) B හා D පමණි.
(5) A, B හා D පමණි.

**46.** නව යොවුන් වියෙහි සංවර්ධනය හා සම්බන්ධ පහත ප්‍රකාශ අතුරෙන් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) ළදරුවිය හා සසඳන කළ, ශාරීරික වර්ධන වේගයෙහි සමානතාවයක් පෙන්නුම් කරයි.
(2) සමාජ නීතිරීති වෙනස් කිරීමට කැමැත්තක් දක්වයි.
(3) සංයුක්ත චින්තන හැකියාව වර්ධනය කර ගනියි.
(4) සමහර අවස්ථාවල දී මුල් ළමා වියෙහි ඇතිවන චිත්තවේග පිළිබිඹු කරයි.
(5) භාෂා වර්ධනය හා බුද්ධි වර්ධනයේ සහසම්බන්ධතාවයක් පෙන්නුම් කරයි.

**47.** යොවුන් වියේ දරුවෙකු පෙන්වන චිත්තවේගීය, ප්‍රජානන සහ සමාජීය ලක්ෂණ පිළිවෙළින් අඩංගු වරණය තෝරන්න.

(1) කෝපාවේගය, සබකෝලය, පරාර්ථකාමීබව
(2) තීරණගැනීම, ඉවසීම, සංවේදීබව
(3) කෝපාවේගය, පරාර්ථකාමීබව, තර්කනය
(4) ඉවසීම, සබකෝලය, තීරණගැනීම
(5) සංවේදීබව, තර්කනය, ඉවසීම

**48.** පෞරුෂය පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් කැවරන් හැඳින් වූ ආකාරය කුමක් ද?

(1) පෞරුෂය ආරයේත්, පරිසරයේත් අන්‍යෝන්‍ය බලපෑම නිසා ඇති වේ.
(2) පෞරුෂය තුළ මනෝභෞතික ගති ලක්ෂණ ඇතුළත් ය.
(3) පෞරුෂය පුද්ගලයාගේ අනන්‍යතාව පෙන්නුම් කරයි.
(4) පෞරුෂය සෑම පුද්ගලයෙක් ම සතු ව පවතින්නකි.
(5) පෞරුෂය සංවර්ධනය කළ හැකි ය.

**49.** ව්‍යවසායකත්වය හා සම්බන්ධ **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) අවදානම් බාරගැනීම ව්‍යවසායකයකු තුළ තිබිය යුතු ලක්ෂණයකි.
(2) ව්‍යාපාර අවස්ථා හඳුනාගැනීම, ව්‍යවසායකත්වය සඳහා වන ප්‍රධාන කාර්යයකි.
(3) අනාගතය පිළිබඳ සිතීම ව්‍යාවසායකයකු තුළ උපතින් ම තිබිය යුතු ය.
(4) අත්දැකීම්, දැනුම හා හැකියාව දියුණු කිරීමෙන් ව්‍යවසායකත්ව සංවර්ධනය සිදු වේ.
(5) ව්‍යාපාරයක් සිදුකිරීමේ දී සමාජ වගකීම් පිළිපැදීම වැදගත් වේ.

**50.** සුළු පරිමාණ ව්‍යාපාර හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - නිෂ්පාදනවලට ඉහළ පිළිගැනීමක් ලබාදීම සඳහා වැදගත් වනුයේ ISO සහ HACCP යන තත්ත්ව සහතික දෙක ය.
B - සියලු ම ව්‍යාපාරික කටයුතු, නීතිරීති තුළින් පාලනය කිරීම අපහසු ය.
C - කළමනාකරණ උපක්‍රම අනුගමනයෙන් සුළු පරිමාණ ව්‍යාපාරයක් ඉහළ තත්ත්ව පාලනයකට ළඟාවිය හැකි ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,

(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A හා B පමණි.
(5) B හා C පමණි.

* * *

Past Papers Wiki



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

ගෘහ ආර්ථික විද්‍යාව II
மனைப் பொருளியல் II
Home Economics II

28 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **හයකට** පිළිතුරු සපයන්න.

**1.** (i) නව නිර්මාණයක් කිරීමේ දී සලකා බැලිය යුතු උපයෝගීතා සාධක **දෙකක්** ලියන්න.

(ii) විද්‍යුතය හා සම්බන්ධ 'ජවය' (ක්ෂමතාව) හඳුන්වන්න.

(iii) දරුවන්ගේ සමෙහි නිරෝගීතාව සඳහා වැදගත්වන ක්ෂුද්‍ර පෝෂක **දෙකක්** සඳහන් කරන්න.

(iv) අධි පෝෂණය නිර්ණය සඳහා යොදා ගන්නා දර්ශක **දෙකක්** ලියන්න.

(v) ඍජු පටියක් හා විකර්ණාකාර පටියක් අතර ඇති වෙනස්කම් **දෙකක්** ලියන්න.

(vi) වාණිජ මැහුම් ක්‍රමවල පෙනුම සහ ක්‍රියාකාරිත්වයට බලපාන සාධක **දෙකක්** නම් කරන්න.

(vii) ප්‍රතිමෝදක ක්‍රියාකාරකම් වර්ගීකරණයට අයත්වන ක්‍රියාකාරකම් කාණ්ඩ **දෙකක්** ලියන්න.

(viii) ආහාරවල අඩංගු ජෛව ක්‍රියාකාරී සංඝටක **දෙකක්** ලියන්න.

(ix) 'වර්තමානයේ කුඩා දරුවන් විද්‍යුත් මාධ්‍යයට ඇබ්බැහි වී ඇත' මෙහි අහිතකර බලපෑම් **දෙකක්** සඳහන් කරන්න.

(x) මානසික පීඩනය සහිත දරුවෙකු පෙන්නුම් කරන කායික ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි.)

**2.** (i) විකර්ණාකාර රේඛා හා වක්‍ර රේඛා මගින් දනවන හැඟීම් **දෙක** බැගින් ලියන්න. (ලකුණු 02 යි.)

(ii) ගොඩනැගිලි නිර්මාණයේ 'සාම්ප්‍රදායික බව' හා 'නූතනත්වය' විස්තර කරන්න. (ලකුණු 04 යි.)

(iii) නිර්මාණකරණයේ මූලධර්ම **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(iv) 'නිර්මාණකරණය හා සම්බන්ධ සන්දර්භය, භෞතික පරිසරය, සමාජ පරිසරය සහ ආර්ථික පරිසරය ලෙස වර්ගකර ඇත.' පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(මුළු ලකුණු 16 යි.)

**3.** (i) 'ක්වොෂියෝකෝර්' තත්ත්වය හඳුන්වන්න. (ලකුණු 03 යි.)

(ii) 'ජීවන චක්‍රයේ විවිධ අවධිවලදී කැල්සියම් ඌනතාව ඇති විය හැකි ය.' එම අවධි සහ අදාළ ඌනතා තත්ත්ව සඳහන් කරන්න. (ලකුණු 03 යි.)

(iii) ආහාරමය තන්තු හෘදරෝග ඇතිවීම වැළැක්වීමට දායකවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(iv) මළ බද්ධයෙන් පෙළෙන වැඩිහිටියෙකුට සුදුසු දිනක බොජුන්පතක් සැලසුම් කරන්න. (ලකුණු 06 යි.)

(මුළු ලකුණු 16 යි.)

PAST PAPERS WIKI

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**4.** (i) ආහාර පරිරක්ෂණය හඳුන්වන්න. (ලකුණු 02 යි.)

(ii) ක්ෂුද්‍ර ජීවී වර්ධනයට බලපාන බාහිර සාධක ලියන්න. (ලකුණු 03 යි.)

(iii) ශීත වියළන ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iv) පැස්ටරීකරණයේ අරමුණු සඳහන් කර, එම ක්‍රියාවලියේ දී භාවිත කරන මූලික ක්‍රමවේද විස්තර කරන්න. (ලකුණු 06 යි.)

(මුළු ලකුණු 16 යි.)

**5.** (i) රෙදි නිෂ්පාදනයේ දී භාවිත කරන තාක්ෂණික ක්‍රමයක් වන 'කෙඳි පිළිස්සීම' හඳුන්වන්න. (ලකුණු 02 යි.)

(ii) වාම් වියමන සහ සරල හීරි වියමන රූපසටහන් මගින් දක්වන්න. (ලකුණු 02 යි.)

(iii) මිනිසා විසින් නිෂ්පාදනය කරනු ලබන කෙඳි වර්ගීකරණය දක්වා, ඒ එකිනෙකට උදාහරණ **දෙක** බැගින් ලියන්න. (ලකුණු 06 යි.)

(iv) නිමි ඇඳුම් කර්මාන්තශාලාවක ඇඳුමක් මැසීම දක්වා සිදු කෙරෙන ක්‍රියාවලියට ඇතුළත් පියවර **හතරක්** අනුපිළිවෙළින් ලියන්න. ඉන් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 06 යි.)

(මුළු ලකුණු 16 යි.)

**6.** (i) පොහොර නිෂ්පාදනයේ දී රසායනික ද්‍රව්‍ය අධිකව යෙදීම තුළින් ඇතිවන පාරිසරික බලපෑම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි.)

(ii) 'ආහාර නිෂ්පාදනයේ දී ගෙවතු වගාව වැදගත් වේ' හේතු **හතරක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 04 යි.)

(iii) 'විවේකය ඵලදායී ලෙස යොදා ගැනීම' පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(iv) 'ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය හා තාරුණ්‍යය' සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

(මුළු ලකුණු 16 යි.)

**7.** (i) ලිංගික පරිනතිය හඳුන්වන්න. (ලකුණු 02 යි.)

(ii) පුද්ගලයෙකුගේ සමබර පෞරුෂය කෙරෙහි වැදගත්වන චිත්තවේගික සමබරතාව පිළිබිඹු කරන ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි.)

(iii) නව යෞවනයන් තුළ මානසික ගැටලු ඇතිවීම කෙරෙහි බලපාන හේතු **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(iv) යොවුන් දරුවෙකුගේ ස්වසංකල්පය ගොඩනැගීමෙහි ලා පාසලේ කාර්යභාරය සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

(මුළු ලකුණු 16 යි.)

**8.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **හතරක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ජීවයේ පැවැත්ම සඳහා මිනිසා හා පරිසරය අතර සම්බන්ධතාව

(ii) ආහාර වේලට කිරි හා කිරි නිෂ්පාදන එක් කර ගැනීම

(iii) සංචාරකයින් සඳහා ක්‍රියාත්මක වන ආයතන හා සේවා

(iv) නව යෞවනියන් සඳහා විවිධ ඇඳුම් මෝස්තර

(v) නව යෞවනයා හා සමවයස් කණ්ඩායම

(ලකුණු $04 \times 4 = 16$ යි.)

* * *

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library